**නිවාස, ඉදිකිරීම් හා ජලසම්පාදන අමාත්‍යාංශය**

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

CIDA

**විද්‍යුත් තැපෑල : info@cida.gov.lk වෙබ් අඩවිය : www.cida.gov.lk**

# පුරප්පාඩු

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පහත සඳහන් පුරප්පාඩු තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩය - (HM 2-1 )

## අධ්‍යක්ෂ ජනරාල් HM 2-1 - තනතුරු 01

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී, ඉංජිනේරු විද්‍යාව / වාස්තු විද්‍යාව / ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම

**සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) / ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය (SLIA) / ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනය (IQSSL) විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක / සංස්ථාවක / රජයේ පිළිගත් ආයතනයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ප්‍රධාන ඉදිකිරීම් කටයුතුවල සියලුම පුළුල් ක්ෂේත්‍රවල "කළමනාකරණ මට්ටමක" වසර 20ක අවම පළපුරුද්දක් ලබා තිබීම සහ ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංජිනේරු විද්‍යාව/ වාස්තු විද්‍යාව/ ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාවේදී උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) / ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය (SLIA) / ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනය (IQSSL) විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සමඟ**

(අ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 1-3) සේවා කාණ්ඩයේ අවම වශයෙන් වසර 07 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම

**සහ**

(ආ) බහුවිධ විෂයන්ගෙන් යුත් කණ්ඩායම්වලට නායකත්වය ලබාදීම සහ මග පෙන්වීමට හැකිවීම, මානව සම්පත සහ වෙනත් සම්පත් නිසිලෙස යෙදවීමේ සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ හැකියාව හා පළපුරුද්ද.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 – 25.03.2025

HM **2-1- 2025 : රු. (161,140 -12 x 4,850 – 219,340)**

(බාහිරව බඳවා ගන්නා අයදුම්කරුවන්ගේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ ස්ථානගත කරනු ලැබේ. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව, ආරම්භක වැටුප් පියවරේ ගෙවනු ලබන වැටුප රු. 140,317/– වන අතර, 2027.01.01 දින සිට ගෙවනු ලබන වැටුප රු. 161,140/– වේ.)

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් හා ජවයකින් හෙබි විය යුතුය.

**වයස් සීමාව :**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ දැනටමත් රජයේ/ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්ට ඉහත සඳහන් උපරිම වයස් සීමාවන් අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය:**

**ජ්‍යෙෂ්ඨ කළමනාකරු ( HM 2-1)**

පත්කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්.

**වෙනත් ප්‍රතිලාභ**

❖ රජය විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් දීමනා.

❖ සේවකයාගේ වැටුප් පදනම් කොටගෙන සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක දායකවීමක් ද, සේවකයාගෙන් 10% ක දායකවීමක් ද සමඟ ආයතනය විසින් සේවකයා වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක් ද බැර කිරීමක් කරනු ලැබේ.

❖ "අග්‍රහාර රන්" වෛද්‍ය රක්ෂණ පහසුකම් ආයතනය විසින් ලබා දෙනු ලැබේ.

❖ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ මඟින් අනුමත හා කලින් කලට සංශෝධනය කරනු ලබන ආකාරයට ප්‍රවාහන පහසුකම් සහ සන්නිවේදන පහසුකම් සපයනු ලැබේ.

**අයදුම් කරන ආකාරය:**

අයදුම්කරුගේ ජීව දත්ත ඇතුළත්ව, නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තිය, පළපුරුද්ද පිළිබඳ සහතික කරන ලද සහතික පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2026 ජූලි 27 දින හෝ ඊට පෙර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වෙත ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, තම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයන් සහිතව, අදාළ තනතුරට තෝරා ගතහොත් දැනට දරන තනතුරින් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතු ය.

අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සපුරා ඇති කෙටි ලැයිස්තු ගත කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,**
**"සව්සිරිපාය", 123, විජේරාම මාවත,**
**කොළඹ 07.**